# ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් ඌවේ දේශ සීමා නිර්ණය

**රදාවානේ සිරිසුමංගල හිමි**

ඓතිහාසික ඌව ප්‍රදේශයේ ජනාවාසකරණය ප්‍රාග් ඓතිහාසික යුගයේදි සිදුවූ බව ප්‍රදේශයේ ගල්ලෙන් හා එළිමහන් පරිශ්‍ර ආශ්‍රයෙන් සිදු කර ඇති පර්යේෂණවලින් පැහැදිලි වේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් වර්තමානය දක්වාම නොයෙකුත් මානව ක්‍රියාකාරකම් මෙම භූමි ප්‍රදේශය තුළ සිදුව තිබේ. ඓතිහාසික යුගයේ පටන් බ්‍රිතාන්‍ය පාලන සමය දක්වාම දේශපාලනික බල අරගලයන්හී දි ඌව ප්‍රදේශය සුවිශේෂි ප්‍රදේශයකි. එම දේශපාලනික බල ව්‍යාප්තිය තුළ ඌව නමින් හඳුන්වන ප්‍රදේශයේ දේශ සීමාවන් විටින් විට වෙනස් විය. එම වෙනස් වීම් සාහිත්‍යමය හා ශිලාලේඛන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් අධ්‍යයනය කිරීම මෙහි ප්‍රමුඛ අරමුණ වේ. ඌව පළාතේ නාම සම්භවය සම්බන්ධයෙන් සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාධක මෙන්ම ජනප්‍රවාදගත තොරතුරු ද අධ්‍යයනය කළ හැකිය. විශේෂයෙන්ම මෙම තොරතුරු "ඌව" යන වචනයේ නිරුක්ත්‍ය හා අර්ථය පැහැදිලි කිරීම සඳහා ඉවහල් වනු ඇත.

වර්තමාන ඌව ප්‍රදේශයට අයත් නොවූවද මඩකලපු දිස්ත්‍රික්කයේ පොතුවිල් අසල "ලයිනමලේ" නම් ස්ථානයෙන් හමු වූ ශිලා ලිපියක කණිට්ඨතිස්ස රජ දවස "සිපවත" නම් විහාරයට දුන් දීමනා පිළිබඳව සඳහන් වීමේදී ඌව යන වචනයට සමාන වදනක් ප්‍රථම වරට සඳහන් වේ. මෙම ලිපිය ක්‍රි.ව 2-4 කාල සීමාවට අයත්ය. මෙම ශිලා ලිපියට අනුව දීමනාකරු

''හුවනක භූජන'' ලෙස සඳහන් වන බැවින් මෙහි ''හුව'' යන්න ''ඌව'' ලෙස අරුත් ගැන්වේ.[1] එමෙන්ම 19 මහාදාඨික මහානාග රජු දවසේ ඌව ප්‍රදේශය ''හුවාව කණ්ණික'' ලෙස හඳුන්වා ඇත.[2] මෙහි ''කණ්ණික'' යන්න ඉඩම් බදුවලින් (ඉඩම්වලින් හෝ භෝගවලින්) අයකර ගැනීම සඳහා වූ ඒකකයකි.[3] ''හුවාව කණ්ණික'' යන්නෙන් ඌව ප්‍රදේශය පදනම්ව පවත්වාගෙන ගිය ඓතිහාසික පාලන ඒකකයක් අර්ථවත් වේ. ඌව යන වර්තමාන යෙදුමට සමාන වචනයක් මහාවංසයෙහි ප්‍රථම වරට සඳහන් වන්නේ මහ විජයබාහු රජු (ක්‍රි.ව. 1055 - 1110) කාල සීමාවේදී ය. මෙම රජු විසින් සමන්තකූට පර්වතය වන්දනා මාන කිරීමට යන ජනයාගේ පහසුව සඳහා ''ඌව රට'' හරහා මහාමාර්ග, නවාතැන් පහසුකම් සම්පාදනය කළ බව සඳහන් වේ.[4] එමෙන්ම පොළොන්නරු යුගය වන විට ඌව පළාත විසිදහස් රට, අට දහස් රට හා දොළොස්දහස් රට ලෙස ව්‍යවහාර කර ඇත.[5] පළමුවන රාජසිංහ රජුගේ කටයුතු විස්තර කරන අවස්ථාවේදි ඔහුගේ පාලන ප්‍රදේශ දැක්වීමේදි කන්ද උඩරට, ඌව, පානම, වෙල්ලස්ස, දහඅට වන්නිය ආදි ප්‍රදේශ දක්වා ඇත. ඒ අනුව මෙකල ඌව, උඩරට රාජධානියට අයත්ව තිබී ඇත. මහනුවර සෙනරත් රාජ්‍ය කාලයේදි (ක්‍රි.ව. 1604-1635) ඔහු විසින් ස්වකීය රාජ්‍යයෙන් ''ඌව රට'' කුමාරසිංහ කුමරුට ද, ''මාතලය රට'' විජයපාල කුමරුට ද, උඩරට රාජ්‍යය රාජසිංහ කුමරුට ද පවරා දෙන ලද බව සඳහන් වේ.[6] මෙම කාලයේදි අධ්‍යයන ප්‍රදේශය ''ඌව රට'' ලෙස හඳුන්වා තිබේ.

පෘතුගීසි ග්‍රන්ථ කතුවරයෙකු වූ ක්වේරෝස් විසින් මෙම ප්‍රදේශය ''ඌව'' නොව ''හුව රට'' විය යුතු බව දක්වයි. එහි අරුත ''උස් ප්‍රදේශය'' යන්න බව ඔහුගේ මතයයි. ඇතමුන් මෙහි අක්ෂරය වෙනසකට භාජනය කරමින් ''ඌරන්ගේ රට'' යන අරුතින් ''ඌරු රට'' ලෙස ද ව්‍යවහාර කරන බව දක්වයි.[7] උක්ත සාහිත්‍යමය තොරතුරුවලට අමතරව ඌව නාම සම්භවයෙහිලා විෂය වන ජනප්‍රවාද රාශියකි. හග්ගල කපොල්ලෙන් සුළං හැමීමේදි හූ හඬ ජනිත වන බැවින් ද, අතීතයේ කඳු මුදුන්වල කිස සඳහා හූ හඬින් ගැමියන් කැඳවූ හෙයින් ද, දුටුගැමුණු රජු



විසින් හූ හඬ පදනම් කරගෙන කතරගම ප්‍රදේශය සඳහා බිම් පිදූ හෙයින් ද ''හුව'' නිශ්පත්තිය වූ බවත් පසුව ''ඌව'' යන්නට පරිවර්තනය වූ බවත් නාවුල්ලේ ධම්මානන්ද හිමියන්ගේ මතය යි. එමෙන්ම ඇතැමෙක් උල්පත් බහුල ප්‍රදේශයක් යන අරුතෙන් ''ඌල්'' යන්න ''ඌව'' යන්නට පරිණාමය වූ බව දක්වති.[8] ආදී කාලීන ගොවීන්ගේ අඩහැරය කියාපෑමේ ශබ්දය පදනම් කරගෙන ගැමියන් විසින් ''හුව'' යන්න භාවිත කොට ඇති බව තවත් මතයකි.[9] මේ ආකාරයට පුරාවිද්‍යාත්මක, සාහිත්‍යමය හා ජනප්‍රවාද ආශ්‍රිත තොරතුරු අනුව ඌව ප්‍රදේශය ''හුව'', ''හූවාව'', ''හූවාව කණ්ණිකා'', ''ඌව රට'', ''ඌව'' යනාදි වශයෙන් හඳුන්වා දී තිබේ. ඇතැම් සාහිත්‍යමය මූලාශ්‍රවල දැක්වෙන තොරතුරු අභිලේඛනමය මූලාශ්‍රයවල දැක්වෙන තොරතුරු මගින් සනාථ වන අතර ජනප්‍රවාද බැහැර කළ යුතු යැයි එමඟින් අදහස් නොවේ.

ඌවේ දේශ සීමා විටෙක පුළුල් වෙමින්ද විටෙක පටු වෙමින්ද වරින් වර වෙනස් වූ බව එහි අතීත දේශ සීමා පිරික්සීමෙන් පෙනේ. ක්‍රි.පූ. 1900 - 1800 කාලයේ විසුවේ යැයි සැලකෙන රාවණා රජුගේ පාලන සමයේදි ඌව දේශය ''ලංකා පුරය'' වශයෙන් හැඳින්වූ බවත්, ඌව මධ්‍යස්ථාන කොට පැවැති දිවයින ''රාවණ රාජ්‍ය'' වශයෙන් පැවැති බවත් ප්‍රකට ජනප්‍රවාදයකි. එමෙන්ම ඌව රාවණාගේ උයන වශයෙන් කඩඉම් පොතේ සඳහන් වේ.[10] එසේ නමුදු පුරාවිද්‍යාත්මක සාධක මගින් මේ පිළිබඳ සත්‍යතාව තහවුරු කොට නොමැත.

ක්‍රි.ව. 1 වන සියවසේදි ''ඌව'' පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වෙනත් ඒ අනුසාරයෙන් එහි දේශසීමා නිශ්චිතවම නිර්ණය කිරීමට සාධක නොමැත. විශේෂයෙන්ම කණිට්ඨතිස්ස රජුගේ (ක්‍රි.ව. 165-193) ''ලයිනමලේ'' සෙල්ලිපියේ ''හුවනක බුජන'' ලෙස සඳහන් වීමේදි ''හුවනක'' යන්න මහාවංශය් සඳහන් 1 වැනි සියවසේ රෝහණයේ ප්‍රදේශයක් ලෙස දැක්වෙන ''හුවාව කණ්ණිකා'' යන්නට සමාන ය.[11] ''හුවාව කණ්ණිකා'' යන්න පසුව ''හුවා රට්ය'' නම් වූ ප්‍රදේශයේ

බෙදීමක් නම් ''හුවරට්ය'' යන්න 1 සියවසේදි පොතුවිල් ප්‍රදේශය නැගෙනහිර වෙරළ තෙක් පැතිරී තිබී ඇත.[12] දිවයින ත්‍රිසිංහලය නමින් හඳුන්වන අවධියේ රුහුණු, මායා, පිහිටි ලෙස ලක්දිව දේශ සීමා වෙන් වූ ආකාරය අනුව ඌව රුහුණු රටට අයත් විය.[13] පැරණි ඌවේ දේශ සීමා අධ්‍යයනයේදී කඩඉම් පොත් මගින් දක්වන දායකත්වය ඉමහත්ය. එහිදී රුහුණු රටට අයත් රටවල් 42 න් ඌව එක් රටක් වශයෙන් සඳහන් වී තිබේ.[14] එසේම වර්තමාන දකුණු පළාතත්, මධ්‍යම හා නැගෙනහිර පළාතේ ඇතැම් කොටසුත් ඓතිහාසික රුහුණු රටට අයත් වී ඇත. එහිදී මහාගාමය හෙවත් මාගම මුල් කරගත් රුහුණු රටට මහවැලි ගඟට නැගෙනහිරින් වූ ප්‍රදේශය, පහළ ඌව, හම්බන්තොට, මාතර හා ගාල්ල යන දිස්ත්‍රික්ක ඇතුළත් වී ඇත. ඒ අනුව ඌව පළාතේ පහළ ඌව ප්‍රදේශය දක්ඛිණ දේශයටත්, තවත් කොටසක් මායා රටටත් අයත් වී තිබේ.[15]

එමෙන්ම මන්දාරම් පුවතට අනුව ඌවට අයත් බදුළු, මහගම සෙංකඩගල, මියුගුණපුර, කතරගම යනාදිය ද රෝහණ රාජ්‍යයට අයත් වේ. පළමුවන උදය රජු දවස (ක්‍රි.ව. 797 - 801) එම රජු විසින් මහින්ද රජුට ආධාර දීමේදි එක් කොන්දේසියකට අනුව රුහුණු රාජධානිය ගල්ඔයෙන් දකුණට සීමා කිරීමට කටයුතු සලසා ඇත. එහෙයින් අනුරාධපුර යුගයේ රෝහණ රාජධානියේ දේශපාලන සීමාවල් ඉතා පටු වූ බව පෙනේ. 13 වන සියවසෙන් පසු අවධියේදි දේශ සීමා වරින් වර වෙනස් වීම්වලට ලක්ව ඇත. මෙකල ඌව ප්‍රදේශය කලින් කලට ප්‍රාදේශීය පාලකයන් යටතේ ද ප්‍රධාන රජුට කප්පම් ගෙවමින් සිටි වන්නියාර්වරුන් යටතේ ද පැවතුනි. 15 වන සියවසේ අගභාගයට අයත් සේනාසම්මත වික්‍රමබාහු රජුගේ ගඩලාදෙනි පුවරු ලිපියේ ඌව ප්‍රදේශය ගැන සඳහන්වීමේදී සිරිසඟබෝ ශ්‍රී ජයවීර පරාක්‍රමබාහු ස්වාමින් වහන්සේ පස්රට වාසීන්ට අභය දානය දුන් බව සඳහන් වේ.[16]

එහෙයින් ගම්පහ, සිදුරුවාන, දෙවිනුවර, බලවිට, මාතලය, හාරිස්පත්තුව හා ඌව යන පස්රට එම රජුගේ අණසකට යටත්ව තිබී ඇත. එමෙන්ම දුබරපන්සියපත්තුව, මාතලේ, ඌව, දෙහිකිඳ,



අළුත්ගම යන රටවල කුදුමහත් සේනාව ජයවීර මහවැඩ උස්තැනට පක්ෂපාතීව සිටි බව නාථ දේවාල ශිලා ලිපියේ සඳහන් වේ.[17] එහෙයින් මෙකල ඌවට අයත් දේශසීමා උඩරට දේශසීමා ආශ්‍රයෙන් නිර්ණය කළ හැකි වේ.

ක්‍රි.ව. 1505 වන විට ද ඌවට අයත් ඇතැම් ප්‍රදේශ උඩරට රජුට කප්පම් ගෙවන වන්නියාර්වරුන් යටතේ පාලනය වුවත් උඩරට රාජ්‍ය බලවත් වෙමින් පැවැති අවධියේදි උඩරට රජවරුන් විසින් ඌවට අයත් සියලුම ප්‍රදේශ උඩරට රාජ්‍යයට ඈඳා පාලනය කරන ලදි. ක්‍රි.ව. 1635 දී සෙනරත් රජුගේ ඇවෑමෙන් පසු මහනුවර රාජධානිය ඔහුගේ පුතුන් තිදෙනා අතර බෙදීමේදි කුමාරසිංහ කුමරුට ඌව රාජධානිය හිමි විය.[18] ක්‍රි.ව. 1635 දී කුමාරසිංහ රජු මරණයට පත්වීමෙන් පසු රාජසිංහ රජු ඌව රාජධානිය උඩරට රාජධානියට ඈඳා ගෙන පාලනය කරන ලදි.[19] ඒ අනුව මහනුවර රාජධානි සමයේදි වැඩි කාල පරිච්ඡේදයක් ඌව, උඩරට රාජධානියට යටත්ව පාලනය වී තිබේ. මේ ආකාරයට ඌව විටෙක ප්‍රධාන රාජ්‍යයට ඈදෙමින් ද විටෙක ප්‍රාදේශීය රාජ්‍යයක් වශයෙන් ද පැවැති සමයේදි එහි දේශ සීමා වරින් වර වෙනස් වූ බව පෙනේ. එමෙන්ම මුලු සිංහලයේ දිසා හා රට ලෙස කොටස්වලට බෙදීමේදි එය නුවරකලාවිය, වෙල්ලස්ස, ඌව, උඩපළාත, හත්කෝරළේ හා බින්තැන්න වශයෙන් බෙදා තිබුණි. ඩොයිලිට අනුව මහනුවර සමයේ දොළොස් දිසාවක් විය. ඊට ඌව, වෙල්ලස්ස හා බිම්තැන්න අයත් විය.[20]

ශ්‍රී ලංකාවේ පාලනය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය විසින් නතු කර ගැනීමෙන් පසුව ඌව පළාතේ දේශ සීමා නිරන්තරයෙන් වෙනස්වීම්වලට ලක් විය. ඌව පළාත් ඉඩම් කාර්යය සංග්‍රහයට (The Mannual of Uwa Province) අනුව 1815 - 1864 කාලය තුළ ශ්‍රී ලංකාවේ පාලනය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයා විසින් පත් කළ නිලධාරි මඩුල්ලක් යටතේ සිදුවිය. එහිදී 1815 පෙබරවාරි 22 වන දින බදුල්ලේ උප ඒජන්ත ධූරයට පත් සයිමන් සොවර්ස් (Simon Sawers) බදුල්ල ප්‍රදේශය ඌව, බින්තැන්න, වෙල්ලස්ස යන දිසා

තුනකට වෙන් කරන ලද බව 1815 - 1864 Uwa Under British Administration හි දක්වේ.

1818 දී උඩරට කැරැල්ල නිමා වීමෙන් පසු ඓතිහාසික යුගයේ සිට වෙනම පරිපාලන ඒකකයක් වශයෙන් පැවැති ඌව ප්‍රදේශය සුළු ප්‍රදේශයක් බවට පත් කරමින් මධ්‍යයම ප්‍රදේශයට ඈඳන ලදි. නමුත් පසුව 1819.11.21 දින ප්‍රකාශයක් නිකුත් කරමින් පාලනය පහසුව තකා ඌව ප්‍රදේශය ඌව, වෙල්ලස්ස, බින්තැන්න, වලපනේ ලෙස කොටස් හතරකට බෙදා දක්වමින් එහි ප්‍රාදේශීය පාලනයේ අධිකරණ බලතල උප ඒජන්ත යටතට පත් කර ඇත. 1819 දී හර්බට් වයිට්ගේ (Herbet White) පරිපාලන වාර්තා අනුව ඌව ප්‍රදේශය ප්‍රාදේශීය වශයෙන් කොටස් 13 කට බෙදා පරිපාලනමය හා ආදායම් උපයා ගැනීම මුල් කරගෙන ප්‍රධානීන් පත් කර ඇත. 1819 දී කළ බෙදීමෙන් පසු "අළුපොත" නමින් පහළ ඌවට අයත් වන පරිදි ප්‍රදේශයක් ද නම් කරන ලදි.[21] එමෙන්ම 1832 දී මෙතෙක් පැවැති සාම්ප්‍රදායික රාජකාරි ක්‍රමය අවලංගු කොට 1833 දී දිස්ත්‍රික් උසාවි හා ඉහළ උසාවි ක්‍රමය ඇරඹීම බ්‍රිතාන්‍ය පාලනයේ සුවිශේෂි අවස්ථාවකි. සමස්ථයක් වශයෙන් ගත් කළ 1833 දී බ්‍රිතාන්‍යයන් සිය පරිපාලනමය හා ආදායම් රැස් කිරීමේ පහසුව මත මුළු දිවයිනම උතුරු පළාත, නැගෙනහිර පළාත, බස්නාහිර පළාත, මධ්‍යම පළාත, දකුණු පළාත වශයෙන් කොටස් 05කට බෙදා ඇත. 1833 දී පළ කළ රජයේ ප්‍රකාශයට අනුව එතෙක් ඌව ප්‍රදේශයට අයත්ව තිබූ බින්තැන්න නැගෙනහිර පළාතටත්, පහළ ඌවේ වෙල්ලස්ස දකුණු පළාතටත්, ඉහළ ඌවේ වියළුම මධ්‍යම පළාතටත් ඈඳන ලදි.[22] පසුව 1839 වසරේදි ඌව ප්‍රදේශයේ කොටස් හම්බන්තොටටත්, මඩකලපුවටත්, නුවර එළියටත් ඈඳන ලදි. එමෙන්ම 1844 දී ඌව නැවතත් කොටස් කිහිපයකට බෙදී ගිය අතර එහිදී මහවැදිරට, දඹගල්ල ආදි ප්‍රදේශ මඩකලපුවෙන් ද, බුත්තල, වැදිරට, කෝංගල, බින්තැන්න ආදි ප්‍රදේශ හම්බන්තොටින් ද පාලනය විය. 1845 සැප්තැම්බර් 25 දිනැතිව රජයේ ගැසට් පත්‍රයක් මගින් මධ්‍යම පළාතට අයත් ප්‍රදේශ නිවේදනය කර ඇති අතර මධ්‍යම පළාතට අයත් ප්‍රදේශ අතුරින්



බොහෝ ප්‍රමාණයක් ඊට පෙර ඌවට අයත් ප්‍රදේශ වීම කැපී පෙනේ. ඒ අනුව නුවර, යටිනුවර, උඩුනුවර, හාරිස්පත්තුව, තුම්පනේ, දුම්බර, හේවාහැට, කොත්මලේ, උඩබුලත්ගම, වෙල්ලස්ස, වියළුව, ඌව, මාතලේ, උඩපළාත, වලපනේ, කොලොවක් ගම්පහ, බින්තැන්නේ, මියන්හේවෙල ආදි ප්‍රදේශ හඳුනා ගත හැකිය.

1867 වන විට ඌව, උඩුකිඳ හා මැද පළාත ප්‍රදේශය, වියළුව, යටිකිඳ, බුත්තල, වැල්ලවාය, බින්තැන්න හා වෙල්ලැස්ස වශයෙන් ප්‍රදේශ 07කට වෙන් කරන ලද බව පෙනේ. ඒ අනුව මෙම ප්‍රදේශ සහිත ඌව සම්පූර්ණයෙන්ම මධ්‍යම පළාතට අයත්ව තිබූ බව 1867-1868 පරිපාලන වාර්තා පරිශීලනයේදී හඳුනාගත හැක.[23] 1885 දී ශ්‍රී ලංකාව පළාත් 06කට බෙදන ලද අතර උතුරු පළාත, දකුණු පළාත, නැගෙනහිර පළාත, බස්නාහිර පළාත, නිරිතදිග පළාත හා මධ්‍යම පළාත ලෙස ඒවා හඳුනාගත හැකිය. එහිදී ද ඌව පළාතට අයත් ප්‍රදේශ බොහෝමයක් ඇතුළුව ප්‍රදේශ 16 ක් මධ්‍යම පළාතට අයත්ව තිබිණි.[24] කෙසේ නමුත් 1886 පෙබරවාරි 05 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් මධ්‍යම පළාත අනුසාරයෙන් සාකච්ඡාවට භාජනය කළ සාධක සැලකිල්ලට ගෙන මෙම ප්‍රදේශ කැටිකොට ඌව ප්‍රදේශය වෙනම පළාතක් වශයෙන් වෙන් කරන ලදි. 1886 දී ගෝර්ඩන් (Garden) ආණ්ඩුකාරවරයා විසින් මධ්‍යම පළාතෙන් ඌව පළාත වෙන් කිරීමේදි එවකට පැවැති බදුල්ල දිස්ත්‍රික්කයට අයත් දේශ සීමා ඇතුළත් වන ආකාරයටම එම වෙන් කිරීම සිදු කරන ලදි. ඒ යටතේ උඩුකිඳ, යටිකිඳ, බින්තැන්න, වෙල්ලස්ස, බුත්තල, වැල්ලවාය හා වියළුව යන ප්‍රදේශ ඌව පළාතට අයත් විය.[25] ඓතිහාසික යුගයේ සිටම ඌව ප්‍රදේශය විවිධ දේශ සීමාවලට යටත්ව විවිධ පළාත්වලට අයත්ව තිබූ බව පෙනේ. වර්තමානයේදි ඌව පළාත බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වන අතර එම පරිපාලන බෙදීම ඇති වූයේ 1960 තරම් මෑතකදි බව ද දැක්විය යුතුය.

## ආන්තික සටහන්


1 Paranavitana. S, (2001), Inscriptions of Ceylon, 2nd, Disa.m (ed), Colombo: Dept of Archaeology. 138p.

2 මහාවංශය, (1996), බටුවන්තුඩාව (සංස්), කොළඹ: ගොඩගේ, 34 පරි, 90 ගාථාව.

3 Vidanapathirana. P, (2012), Settlement patterns of Malvatu Oya and Kala Oya Basins, Post Graduate Institute of Archaeology, University of Kelaniya, 245p.

4 මහාවංශය, (1996), බටුවන්තුඩාව (සංස්), ගොඩගේ, ගොඩගේ, 60 පරි, 64-66 ගාථා.

5 අභයවර්ධන, එච්.ඒ.පී, (1978) කඩයිම්පොත් විමර්ශනය, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව, පි. 11

6 මහාවංශය, (1996), බටුවන්තුඩාව (සංස්), කොළඹ: ගොඩගේ, 95 පරි, 23 ගාථාව.

7 Queroz, (1930), Def. Conquest of Ceylon, Colombo, 63p.

8 ධම්මානන්ද, නාවුල්ලේ, (1966), ඌව ඉතිහාසය, කොළඹ: ගුණසේන. පි. 7

9 මද්දුම බණ්ඩාර සී.එම්., (1991), ඌවේ පාරසරික භූගෝල විද්‍යාව, සංස්. වි. වාතමු. තිලකසිරි බණ්ඩාර, ඌව වංශ කථාව, ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යංශය. පි. 7

10 අභයවර්ධන, එච්.ඒ.පී, (1978), කඩයිම්පොත් විමර්ශනය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව. පි. 208

11 Paranavitana. S, (2001), Inscriptions of Ceylon, 2nd, Disa.m (ed). Colombo: Dept. of Archaeology. 138p.

12 නිකලස් සී.ඩබ්, (1979), පුරාතන ලංකාවේ ඓතිහාසික විස්තර, (පරි.) එස්. ජයවර්ධන දෙහිවල: ප්‍රකාශකයෝ, පි. 26

13 අභයවර්ධන, එච්.ඒ.පී, (1978), කඩයිම්පොත් විමර්ශනය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව. පි. 71

14 එම, පි. 111-112

15 නිකලස් සී.ඩබ්, (1964), ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, I භාගය, විශ්වවිද්‍යාල මුද්‍රණාලය. පි. 12

16 Paranavitana. S, Gadaladeniya Rock, (1944), Inscription, EZ, 4, Lonodon, Oxford University Press. 21p.

17 Ibid, 31p.





18 මහාවංශය, බටුවන්තුඩාව (සංස්), (1996), කොළඹ: ගොඩගේ, 95 පරි, 22-23 ගාථා.

19 එම, 96 පරි, 01-07 ගාථා.

20 විමලකිත්ති මැදඋයන්ගොඩ, (1955), සිංහල ආණ්ඩුව, අනුලා මුද්‍රණාලය. පි. 39

21 Administration Report, 1815-1846, Uwa Under the British Administration.

22 Mendis G.C., (1946), Ceylon Under the British Rule, The Colombo Apothecaries. co. ltd, Education Publishers, 39p.

23 Sharp W. E., (1867), Ceylon Administration Report, Colombo: Ceylon Government Press. 95P.

24 Ibid, 1985, 102p.

25 Mendis G. C., (1946), Ceylon Under the British (2) ed, The Colombo Apothecaries' Co. ltd, Education Publishers. 84p.